සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

21 S I,II

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

සිංහල භාෂාව හා සාහිත්‍යය - I,II
Sinhala language and literature - I,II

පැය තුනයි
Three hours

04 APR 2019

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. ඉතාමත් දිළිඳු දැරියක වූ සමන්මලී ලද ජාතික මට්ටමේ ජයග්‍රහණය නිසා ඈ කටු ගාලේ පිපුණු මලක් යැයි විදුහල්පති තුමා පැවසුවේ ය.
(1) කටු සහිත වැල්වල පිපුණු මල් (2) දුෂ්කර ස්ථානයක බිහි වූ වටිනා දෙයක්
(3) කටු පඳුරු සහිත තැනක පිපුණු මලක් (4) ළඟා විය නොහැකි තැනක පිපුණු මලක්

02. එකල පැවති මාධ්‍ය වාරණය කට වටේ වැට බැඳීමක් යයි විද්වත්හු පැවසූ හ.
(1) පුවත්පත් බැලීමේ නිදහස අහිමි කිරීම (2) ජනතාවට මාධ්‍ය නිදහස තහනම් කිරීම
(3) ජනතාවගේ කතා කිරීමේ නිදහස අහිමි කිරීම (4) ජනතාවට කිසිවක් කතා කිරීම අහිමි කිරීම

03. විදෙස් රැකියාවක නියුතු ව සිටි පැමිණි ඔහු තම මිතුරන් වෙනුවෙන් අත දිග හැර මුදල් වියදම් කළේ ය.
(1) නිර්ලෝභී ව (2) උපායශීලී ව (3) අකමැත්තෙන් (4) අතේ ඇති

- අංක 04 සිට 06 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. සිංහල ව්‍යාකරණයෙහි .................................................. සඳහා මුනිදාස කුමාරතුංග පඬිවරයාගෙන් වූ සේවය මිල කළ නො හැකි ය.
(1) විකාශනය (2) පරිණාමය (3) ආභාසය (4) චිරස්ථිතිය

05. අපේ රටේ ගොවීන්ගේ හා වතු කම්කරුවන්ගේ .................................................. සඳහා රජය ක්‍රියා මාර්ග ගත යුතු ය.
(1) සුබ සිද්ධිය (2) පැවැත්ම (3) වෘත්තිය පුහුණුව (4) සුබ සාධනය

06. චෛත්‍යයෙහි බුබ්බුලාකාරය නැංවුණේ වේදිකා භූමි හෙවත් .................................................. යන නමින් හැඳින්වුණු කෙමෙන් පිහිටි තුන්මාල් පේසාව උඩ ය.
(1) පටිමාසර (2) පාද පීඨිකා (3) වාලිකාංගණ (4) පුප්ඵාධාන

07. අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) ඇමරිකාව, තායිලන්තය, ඉන්දියාව, ග්‍රීසිය
(2) ගම්පෙරළිය, බැද්දේගම, යුගාන්තය, හිඟනකොල්ලා
(3) ගාල්ල, යාපනය, කොළඹ, මහනුවර
(4) කළු ගඟ, මැණික් ගඟ, ගිං ගඟ, කැලණි ගඟ

08. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) කනිෂ්ඨ, ත්‍යාග ප්‍රදානය, මර්දනය, සනාන්ධකාරය
(2) ලේඛණ, ජයග්‍රහනය, අධිෂ්ඨාන, ප්‍රශ්න
(3) ශ්‍රවණ, තීක්ෂන, දෙරණ, පරිගනකය
(4) විමර්ශණ, සංවර්ධනය, ප්‍රවීණ, සම්භාවනීය

09 එක් එක් වචනයෙහි දෙවෙනි අකුරෙහි පාපිල්ල, ඉස්පිල්ල, දීර්ඝ ඇදය හා රේඵය පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

(1) රුවල, පිළිතුර, නිර්වාණ, මාර්ගය (2) කකුළු, අධිෂ්ඨාන, පැළැටි, වර්ෂාව

(3) ගෝත්‍රය, පිළිම, ධර්මය, කැලැව (4) දකුණ, ආභාසය, විහාරස්ථානය, මාර්ගස්ථ

10. 'මග සිටියොත් තෝ නසී
ගෙදර ගියොත් අඹු නසී' ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය සහිත වරණය තෝරන්න.

(1) පූර්ව ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා (3) අසම්භාව්‍ය ක්‍රියා (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා

11. බලන්න බුදු සාමිනී, දරන්න බැහැ සෝගිනී
ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය සහිත වරණය තෝරන්න.

(1) විධික්‍රියා (2) ප්‍රයෝජ්‍ය ක්‍රියා (3) පූර්ව ක්‍රියා (4) මිශ්‍ර ක්‍රියා

12. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) මිනිසෙක්, දෙවියෙක්, ඇතින්නක, බඹරෙක් (2) ශිෂ්‍යාවක්, ළමයි, ඔවුන්, මම

(3) ගුරුවරු, මා, වඳුරෙක්, පාඨකයෝ (4) අපි, ඔවුහු, ගැහැනියක්, ලේඛකයෝ

13. ඉතිහාස + ඉක යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දක්වෙන වරණය තෝරන්න.

(1) ඉතිහාසික (2) ඓතිහාසික (3) අයිතිහාසික (4) ඓතිහාසීක

- අංක 14 සිට 17 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දක්වෙන වරණය තෝරන්න.

14. සාහිත්‍යික භාෂාව **ධ්වනිපූර්ණ** විය යුතු ය.

(1) පැරණි කාලයට අයත් භාෂාව

(2) කාව්‍යය සඳහා යොදා ගන්නා කවි කියමන්

(3) අවස්ථාවට සුදුසු තැනටත් කාලයටත් ගැළපෙන

(4) මතුපිට අර්ථය ඉක්මවා යන සැඟවුණු අර්ථයකින් පෝෂණය වූ

15. "ඒ අසමින් සකල **ජනානන්දකර** වූ තිලෝගුරු බෝධිසත්වයන් වහන්සේ ..........."

(1) ජනතාව අසතුටට පත් කරවන (2) ජනතාවට සතුටක් ඇති කරවන්නා වූ

(3) ජනතාවගේ සුබසෙත පිණිස කටයුතු කරන (4) සියලු ම ජනතාවට පිහිට වන්නා වූ

16. සාහිත්‍ය නිර්මාණකරුවා සතු **පරිකල්පනය** පාඨක මනස චමත්කාරයට පත් කිරීමට සමත් වේ.

(1) අනුමාන සිතිවිල්ල (2) නැවත සිතා බැලීම

(3) අලුත් නිර්මාණ කිරීමේ සිතුවිල්ල (4) නිරන්තර අභ්‍යාසය

17. " ෆ " යනු **ඕෂ්ඨජ** අක්ෂරයකි.

(1) තොල්වලින් හට ගන්නා (2) මුදුනින් හා තොල්වලින් හට ගන්නා

(3) දත්වලින් හා තොල්වලින් හට ගන්නා (4) උගුරෙන් හා තොල්වලින් හට ගන්නා

18. " වඳිමු සුගත ශාක්‍ය සිංහ සසර දිනූ බුදු පියා " ඉරි ඇඳි පදය පිළිබඳ ව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) අතීත කාල උත්තම පුරුෂ ඒක වචන ආඛ්‍යාතයකි.

(2) වර්තමාන කාල උත්තම පුරුෂ බහු වචන ආඛ්‍යාතයකි.

(3) වර්තමාන කාල මධ්‍යම පුරුෂ බහු වචන ආඛ්‍යාතයකි.

(4) අතීත කාල උත්තම පුරුෂ බහුවචන ආඛ්‍යාතයකි.

19. මුලින් දක්වෙන අක්ෂර වර්ගයට අයත් අක්ෂරයක් නොයෙදුණු වචනය සහිත වරණය තෝරන්න.

| | | |
|---|---|---|
| (1) | අල්පප්‍රාණ | බල්බය, සමාජය, කමත, පදක්කම |
| (2) | සඤ්ඤක | අඩනවා, ලඹය, අඟල, ළිඳ |
| (3) | නාසික්‍ය | මංගල, සමරුම, හුණ්ඩුව, වඤ්චා |
| (4) | තාලුජ | ජන්දය, ඤාණ, සිළුමිණ, චන්ද්‍රයා |

20. කණ්ඨජ අක්ෂර පමණක් යෙදුණු වරණය තෝරන්න.

(1) ක, ඛ, ග, ස, ඞ (2) ප, ඵ, බ, භ, ම (3) ත, ථ, ද, ධ, න (4) ය, ර, ල, ව, හ

21. එක් එක් පද පේළියේ දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (1) දන - ජනයා, | වත - මුහුණ, | කර - පා, | නා - ඇතා |
| (2) උපුල් - මානෙල්, | උත්තර - උතුරු, | සැවුළා - කුකුළා, | වස්ත්‍රය - වත |
| (3) රුක - ගස්, | පියුම - නෙළුම, | පක්ෂියා - විහඟ, | නල - ගින්දර |
| (4) අඹ - ජලය, | පන්හිඳ - පෑන, | මහීෂ - හරකා, | චන්ද්‍රයා - තරුපති |

22. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නො දෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) තඹර - කමල, පද්ම, සියපත, අරවින්ද

(2) පොළොව - මහී, වසුන්දරා, දෙරණ, මිහිකත

(3) සාගරය - සයුර, සිඳු, රුවනාර, නිසයුරු

(4) අනංගයා - මීන්දද, මල්සරා, මනයොන, කුසුමසරා

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) අවංක - සෘජු (2) මල - විමල (3) බල - දුබල (4) චල - නිශ්චල

24. යුගල පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| (1) නඩු - හබ, | යාම් - ඊම්, | උඩක් - බිමක්, | අරුම - පුදුම |
| (2) රැවුම් - ගෙරවුම්, | ළමයි - බමයි, | මුදල් - හදල්, | අහල - පහළ |
| (3) අඟර - දඟර, | යන්ත්‍ර - මන්ත්‍ර, | කතුරු - මිතුරු, | හඬන - දොඩන |
| (4) නඩු - හබ, | එහෙ - මෙහෙ, | ලෙඩ - දුක්, | ලියුම් - කියුම් |

25. ධාතු ප්‍රකෘති පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) නට, බල, කර, හඬ හඬා (2) ඇඹූ, කඩදුව, නැටුවොත්

(3) කපන, බල, අසමින්, රඟ (4) දුව, අස, කප, නට

26. වැරදි අදහසක් දෙන ප්‍රකාශය තෝරන්න.

(1) ' ස ' අක්ෂරයට පසුව ' ණ ' නොයෙදේ.

(2) ' ණ ' අක්ෂරයෙන් ආරම්භ වන එක ම වචනය ' ණය ' වේ.

(3) ' ශ ' අක්ෂරයට පසුව ' න ' යෙදේ.

(4) ' ර් ' හැර ව්‍යඤ්ජන අක්ෂරයට පසුව යෙදෙන ' ය ' අක්ෂරය වෙනුවට ' ‍්‍ය ' යෙදේ.

27. පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) රා ං පු ළ චි ර (2) ලි ග ක ය ග යු (3) ළු ඹ වෝ හ අ ය (4) කො ං ට සෙ ට් ං ට

- අංක 28 හා 29 ප්‍රශ්න යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

28. උරුලෑවා ගිය පාර වගේ වීම.

(1) උරුලෑවා ගිය පාර පහසුවෙන් සොයා ගත හැකි වීම.

(2) දුර්ලභ ගණයේ සත්ත්ව විශේෂයකි.

(3) පාරවල්වල ගමන් නොකරන සත්ත්වයෙකි.

(4) අසත්පුරුෂයා ගිය ගිය තැන නරක ම කරයි.

29. කැත්ත හොඳින් කැපෙන්නේ කරෙන් කැඩෙන්නයි.

(1) කැපෙන කැත්තේ කරෙන් කැඩීමේ ප්‍රවණතාවයක් ඇත.

(2) ඉතා හොඳ දෙයෙහි ආයුෂ අඩුය.

(3) කැත්ත මුවාත් තැබුවත් මීට ශක්තිමත් නැත.

(4) කැත්තත් මීටත් ශක්තිමත් ව තිබිය යුතුය.

30. A - අඹ - පැපොල්

B - සකලයා - වඳුරා

C - කොකිස් - කිරිඅල

D - බකප්පච්චි - බාප්පා

යන ප්‍රාදේශික ව්‍යවහාර පොදු ව්‍යවහාරයෙන් නිවැරදි ව ගැළපී ඇති වරණය වන්නේ,

(1) A හා B පමණි (2) B හා C පමණි (3) C හා D පමණි (4) A හා C පමණි

- අංක 31 සිට 33 දක්වා දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

31. (1) භික්ෂූන් වහන්සේ දහම් දෙසුවේ ය. (2) ළමා පෙළ පන්ති කාමරයට පිවිසෙති.
(3) සමහරුන් විශ්ව විද්‍යාලයට යති. (4) කොටියා වනය දෙවනත් කරති.

32. (1) අයෙක් නැටුමට දක්ෂ වෙති. (2) සියොත් පෙළ අහසේ පියාඹයි.
(3) තරු පෙළ අහසෙහි බබළති. (4) දුවණියෝ මවට උවටැන් කරයි.

33. (1) ගොවීන් විසින් කුඹුරු වපුරනු ලබති. (2) ගුරුවරු විසින් පාඩම් උගන්වනු ලබයි.
(3) විදුහල්පතිතුමා විසින් ශිෂ්‍යයෝ අමතනු ලබති. (4) වෙළෙන්දන් විසින් බඩු විකුණන ලදහ.

34. A - චිරන්තන සාහිත්‍ය පරිහරණය කළ .................................... පුද්ගල ආකල්ප සංවර්ධනය වේ.
B - සුන්දර ස්ථාන නැරඹීමට .................................... පරිසරයට පොලිතින් බැහැර නොකරමු.
C - පොදු දේපළ .................................... ඇල්මැති පුරවැසියාට තිබිය යුතුය.
D - බුදුන්වහන්සේ උකටලී වූ භික්ෂුවක .................................... මෙම දේශනාව වදාළ සේක.

E - ගොස්, F - අරහයා, G - හොත්, H - පිළිබඳ

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
(1) F, H, E, G (2) G, E, H, F (3) H, G, F, E (4) H, E, G, F

35. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"අප වේදිකා නාට්‍ය නැරඹීමට නගරයට යනවා."
(1) අපි නිතර වේදිකා නාට්‍ය නැරඹුවෙමු.
(2) අප වේදිකා නාට්‍ය නැරඹීමට නගරයට යමු.
(3) වේදිකා නාට්‍ය නගරයට පමණක් පැමිණෙන නිසා අපි නගරයට යමු.
(4) අපි වේදිකා නාට්‍ය නැරඹීමට නගරයට යමු.

36. "සක්වා ළිහිණි" පද්‍ය සංග්‍රහයේ කතුවරයා වන්නේ
(1) මහගමසේකර මහතා (2) විමල් දිසානායක මහතා
(3) ගුණදාස අමරසේකර මහතා (4) ඩබ්. ඒ. අබේසිංහ මහතා

37. උපමාලංකාරයක් රහිත වරණය තෝරන්න.
(1) මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී
(2) කලා වැවේ නිල් දියවර අපෙ අම්මා
(3) පොහොය නැති දු - සිල් ගත් බඳු
(4) හොඳ ළමයින් මුතු වගේ ය

38. පහත සඳහන් කවියේ තුන්වැනි පදය තෝරන්න.

කෙලෙස් මල පිරි නුවර අතහැර
බවුන් වඩනට වනේ වැඩි ඔබ
..........................................................
අපගේ පිහිටක් නොමැති වූ විට

(1) සොයා ආයෙමි පොළෝ තලයේ (2) ජීවිතේ යම් පලක් ඇත්නම්
(3) නැගෙන ඔබගේ යෝධ බුදු බඳ (4) මගේ කුඩු බව පසක් කර ඇත

39. "රජ්ජුරුවන්ගේ අණබෙරකාරයා නේද? මොකක් ද මේ හදිසි නිවේදනය ? යුද්ධයක් වත් ද? නැත්නම් කැරැල්ලක් ද? මෙම සංවාද ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?
(1) පබාවතී (2) ගුරු තරුව (3) හුණුවටයේ කතාව (4) මහාසාර

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන වරණය තෝරන්න.
"එදා ධනවතුන්ගේ ප්‍රවේණි උරුමයක් ව පැවති අධ්‍යාපනය දුගී දුප්පතුන්ගේ සදාකාලික උරුමය බවට පත් විය."
(1) එදා ධනවතුන්ගේ අධ්‍යාපනය දුප්පතුන්ගේ උරුමය බවට පත් විය.
(2) එදා ධනවතුන්ට මෙන් ම දුප්පතුන්ට ද අධ්‍යාපන ප්‍රවේණි උරුමයක් විය.
(3) එදා ධනවතුන්ගේ පාරම්පරික උරුමයක් ව තිබූ අධ්‍යාපනය දුගී දුප්පතුන්ගේ සදාකාලික උරුමය බවට පත් විය.
(4) එදා අධ්‍යාපනය ධනවතුන්ට වඩා දුප්පතුන්ගේ ප්‍රවේණි උරුමයක් බවට පත් විය.

(ලකුණු 40 යි.)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

21 S I,II

පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

සිංහල භාෂාව හා සාහිත්‍යය I-II
Sinhala language and literature I-II

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

- අංක (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ) කද (ආ) කඳ

(ii) සිංහල අක්ෂර මාලාවේ

(අ) තාලුජ අක්ෂර 02 ක් (ආ) ඕෂ්ඨජ අක්ෂර 02 ක් ලියන්න.

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

මිහිඳු හිමියන්ගේ දීර්ඝකාලීන කැපවීමේ ප්‍රථිඵලයක් වශයෙන් අප රටට සිදු වූ යහපත විශිෂ්ඨ සම්පතකැයි. විවාදයෙන් තොරව පිළිගත යුතු ය.

(iv) පහත සඳහන් නාම පදවල නාම ප්‍රකෘතිය ලියන්න.

(අ) සිංහයෙක් (ආ) රජිනක්

(v) "කප" යන ධාතු ප්‍රකෘතියෙන් සාදා ගත හැකි,

(අ) ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් (ආ) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් ලියන්න.

(vi) පහත සඳහන් පදවලට සුදුසු තනි පද ලියන්න.

(අ) උසට ගැළපෙන මහතින් යුතු (ආ) කිසිවෙකුට දෙවැනි නොවන

(vii) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) ප්‍රපාතය (ආ) ආශිර්වාදය

(viii) පහත සඳහන් පදවල අර්ථය ලියන්න.

(අ) පරිචය - (ආ) කුළුගැන්වීම -

(ix) පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) ඔවුහු අප සුහදව පිළිගත්හ. -

(ආ) ගොවීහු එළවළු වගා කරති. -

(x) පහත සඳහන් අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළු ලියන්න.

(අ) නුසුදුසු පිළියම් යෙදීම (ආ) නැති වූ දෙයෙහි අගය වැඩිය.

(ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. (ල. 25)

(අ) අද සමාජයේ වින්දනීය ම සන්නිවේදන මාධ්‍ය රූපවාහිනියයි. එයින් ප්‍රචාරය වන විවිධ වැඩසටහන්වලින් අපගේ දැනුම් සම්භාරය හා වාක්කෝෂය පුළුල් කර ගත හැකි ය. එමෙන් ම එහි වටිනා ටෙලි නාට්‍ය හා අවර ගණයේ හින්දි හා මෙගා ටෙලි නාට්‍ය විකාශනය වීමෙන් පවුල් සංස්ථාව ඊට ගොදුරු වී ඇත. සමස්ත සමාජය පොත පත කියවීමෙන් බැහැර වී ඇති නිසා රූපවාහිනිය සෑම අංශයකට ම ප්‍රබල බලපෑමක් කර ඇත. කාසියක දෙපැත්ත මෙන් ඕනෑ ම දෙයක හොඳ නරක දෙකක් ඇත. හංසයා දියෙන් කිරි වෙන් කර ගන්නාක් මෙන් රූපවාහිනියේ ඇති හොඳ දේවල් තෝරා බේරාගෙන නැරඹීමෙන් අපගේ කාලය හා ජීවිතය අර්ථවත් කර ගැනීමට කාලය එළඹ ඇති බැවින් පාසල් පද්ධතියෙන් සමාජ ශෝධනයක් කළ යුතුයි.

(ආ) ස්වභාව ධර්මයත් මිනිසාත් අතර පවතින්නේ අවියෝජනීය සම්බන්ධතාවයකි. " පරිසරය අප රකියි - රකිමු අපි පරිසරය". වචනවලට ම සීමා වූවකි. මිනිසා හා ස්වභාව ධර්මය අතර සම්බන්ධතාව පවත්වා ගැනීමේ දී ස්වභාව ධර්මය විසින් ලබා දෙනු ලබන සම්පත් සංරක්ෂණය කර ගැනීමට අවශ්‍ය වන්නේ ය. වර්තමානයේ දී මේ කාර්යය සඳහා බාධාකාරී ලෙස බලපාන හේතු සාධක අතිශය බේදජනක වේ. විශේෂයෙන් ම කෘමිනාශක භාවිතය, පොලිතින් භාවිතය, වන සංහාරය ඒ අතරින් කරුණු කිහිපයක් පමණි. ස්වභාව ධර්මය සුරක්ෂිත කර ගැනීමේ භාරදූර වගකීම සමස්ත සමාජයට ම භාර වන්නේ ය.

(ඉ) දිනෙන් දින ම මාධ්‍යයෙන් මෙන් ම සමාජයෙන් අසන්ට ලැබෙන අපරාධ පිළිබඳ ව අපට කියා පාන්නේ ආර්ථික හා සමාජීය නොදියුණු බවයි. ආර්ථික මෙන් ම මානව සම්බන්ධතාවල ඇති අඩු ලුහුඬුකම් ද මේ අපරාධ රැල්ලට හේතු වී ඇත. රජය අධ්‍යාපනයට විශාල සම්පත් වැය කළ ද ඉන් පුද්ගලයාට ලැබෙන්නේ හදවතක් නොව ඔළුවක් පමණි. ආකල්පමය අධ්‍යාපනයක් තුළින් පුද්ගලයාට ගැටලුවල දී අත පය මෙහෙය වීමෙන් තොර ව බුද්ධියෙන් සටන් කිරීමෙන් ඕනෑ ම ගැටලුවකට විසඳුම් සෙවිය හැකි බව මහෞෂධ පඬිතුමාගේ චරිතයෙන් ද විද්‍යමාන වේ. අත පය විසි කිරීමෙන් තොර ව විචාර බුද්ධියෙන් ගැටලු විසඳීමටත් මානව දයාවෙන් යුතු සහකම්පනයෙන් ජීවත් වීම බුද්ධිමත් සමාජයක ලක්ෂණයකි. ඒ අනුව අද අපේ රට ගමන් කරන්නේ කොයිබට ද? ගැටලුව ගැන සිතමු.

(ඊ) සෞඛ්‍ය සම්පන්න ජනතාවකගේ පැවැත්ම සඳහා ක්‍රීඩාවෙන් සැලසෙන සේවය අති විශාල ය. ජයෙහි දී මෙන් ම පරාජයෙහි දී ද නොසැලී සිටීමටත් විනෝදයෙන් කාලය ගෙවීමටත් ක්‍රීඩා මගින් ලැබෙන පරිචය, අගය කළ යුතු ය. එහෙත් අන්තර් පාසල් "බිග්මැච්" සංස්කෘතියෙන් නාගරික මධ්‍යම පන්තික හා ධනපති පාන්තික සමාජයේ නිස්සාර බවේ අඬහැරය සමාජය දෙදරවයි. මෙවන් සැණකෙළි පවත්වන අප සමාජය තුළ ම කුසට අහරක් නැති හිසට සෙවණක් නැති විදුලි ආලෝකයක් නෙත නුදුටු දරු කැලක් ද ජීවත් වෙති. ක්‍රීඩාවෙන් ලබන විනය හා ශික්ෂණය සමාජ සුබසාධනයට යෙදවීම සදාකාලික මානසික තෘප්තියට හේතුවකි.

(ලකුණු 25)

03 පහත දැක්වෙන පාඨය වචන 65 - 75 ත් අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන ගණන සාරාංශයේ අග ලියන්න.

ලංකාව විදේශීය ආධිපත්‍යයට අසුවීමට පෙර මුළු රටේ ම අධ්‍යාපනය පැවතියේ ඒ ඒ ගම්වල පැවති පන්සල් මගිනි. පන්සල් මගින් මූලික අධ්‍යාපනයක් ලැබීමෙන් පසු උසස් අධ්‍යාපනයක් ලබා දීම සඳහා හැම පෙදෙසකම ගම් කීපයකට එක පිරිවෙනක් බැගින් පිහිටුවා තිබුණේ ය. කෝට්ටේ හෙවත් ජයවර්ධන පුර සමය වන විට ලංකාවේ පැවති උසස් පිරිවෙන් සංඛ්‍යාවක් ලංකා ඉතිහාසයෙහි සඳහන් වෙයි. එහෙත් පහත රට පරංගීන් සතු වීමෙන් පසු මේ පිරිවෙන් සියල්ල ම අභාවයට පත් වූ බව සැලකිය හැකි ය. ඕලන්ද සමයේ ද පන්සල් අධ්‍යාපනයට සහ පිරිවෙන් අධ්‍යාපනයට කිසි ම රුකුලක් හෝ ලැබුණේ ය. ඉංගිරිසි ආණ්ඩුව ද මුල් කාලයේ ක්‍රියා කළේ පන්සල් අධ්‍යාපනය සහ පිරිවෙන් අධ්‍යාපනය නැති කර දැමීමට ය. එහෙත් භික්ෂූන් වහන්සේගේත් බෞද්ධ මහ ජනයාගේත් උනන්දුව නිසා ආරම්භ කරන ලද පිරිවෙන් කිහිපයකට යටත් විජිත ආණ්ඩුව විසින් ආධාර දීමට පටන් ගන්නා ලදී. එහෙත් එය පුංචි අම්මාගේ සැලකිල්ලට වඩා වැඩි වෙනසක් නොවූ බව කිව හැකිය. රට නිදහස් වීමෙන් පසු ද පසුගිය ආණ්ඩුව පිරිවෙන්, අධ්‍යාපනයට දිය යුතු උසස් තැන නුදුන් බව රහසක් නොවේ. මහජන ආණ්ඩුව විසින් පිරිවෙන් දෙකක් විශ්ව විද්‍යාලයීය තත්ත්වයට ගෙන ඒමට තැත් කරන අතර, අනික් පිරිවෙන්වල තත්ත්වය ද දියුණු කිරීම සඳහා දැනට දෙනු ලබන ආධාර මෙන් දෙගුණයක් ආධාර දීමට තීරණය කර ගැනීම ඉතා වැදගත් බව සැලකිය යුතු ය. මේ වන තුරු පිරිවෙන්

සම්බන්ධයෙන් පැවැති මූලික හා උපරිම යන භේදය ආධාර දීමේ දී මින් මතුවට නොසැලකීමට ගත් තීරණය ද මහාජන ප්‍රසාදයට හේතු විය.

(ලකුණු 10)

04 පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

පෘතුගීසි උවදුරෙන් බේරෙන්ට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඕලන්දයෙන්ගේ පාලන බලයට යටත්විය. අවුරුදු එකසිය පනහක් පමණ පහත රට ආණ්ඩු කළ ඕලන්දකාරයෝ ද ශිල්ප ශාස්ත්‍ර දියුණු කිරීමෙහි නිරත නො වූහ. වෙළඳාමෙන් ධනය සම්බ කිරීම ඔවුන්ගේ එක ම අභිලාෂය විය. මේ සමයෙහි ස්වාධීන සිංහල රාජ්‍යයක් උඩරට පළාත්වල පැවති නමුත් දකුණු ඉන්දියානු ද්‍රවිඩ රජවරු එහි රජකම් කළ කැඩී බිඳී යන පැරණි රදළ ක්‍රමයකින් යුක්ත උඩරට සිංහල සමාජය අතර මනුෂ්‍ය ශිෂ්ටාචාර යේ උසස් අංග විද්‍යමාන නොවීය. සිංහල හෝ දමිළ හෝ යමතම් ලියන්නට කියවන්නට ඉගෙන ගැනීමක් හැර අන් කිසි අධ්‍යාපනයක් එකල උඩරට හෝ පහතරට නො තිබුණේ ය. අවුරුදු තුන්සියයක්ට පෙර පටන් පිරිහෙමින් පැවති චිත්‍ර ශිල්පයක් සංගීතයත් මේ කාලයේ දී සිංහලයන් අතුරින් සම්පූර්ණයෙන් ම බැහැර ගොස් තිබුණු බව පෙනෙන්නට ඇත්තේ ය. ආගමික කෘත්‍යයන්ට ද යාග හෝමාදියට ද අවශ්‍ය වූ නිසා නැටුම් ශිල්පය රක්ෂාවක් කොට ගත් ඇතැම් කුලවල මිනිස්සු නාට්‍ය ශිල්පය ආරක්ෂා කළහ. ලංකාවේ පැරණි කලාවන් අතුරින් නාට්‍ය ශිල්පය පමණක් සිංහලයන් අතර පැවතුණේ මේ නිසා ය.

(i) ලංකාව පාලනය කළ විදේශීය ජාතීන් දෙකක් නම් කරන්න.

(ii) එකල ස්වාධීන සිංහල රාජ්‍යයක් පැවති ප්‍රදේශය කුමක් ද?

(iii) එකල පැවති අධ්‍යාපනයේ තත්ත්වය කෙබඳු වී ද?

(iv) සිංහලයන් සතුව පැවති ශිල්පයන් දෙකක් නම් කරන්න.

(v) පහත සඳහන් වචනවල තේරුම් ලියන්න.

(i) අභිලාෂය (ii) කෘත්‍යයන්

(ලකුණු 2 x 5 = 10)

05 වර්තමානයේ පාසල් දරුවන් තුළ මුදල් ඉතිරි කිරීමේ පුරුද්ද ගිලිහී ගොස් ඇත. ඕනෑම දෙයක් ඉතිරි කිරීම හා අරපිරිමැස්ම ළමා වියේ සිට ම පුරුදු පුහුණු කළ යුතු ය. ඔබ වාණිජ විද්‍යා සංගමයේ ලේකම් අසේල මුදුන්කොටුව යයි සිතා විද්‍යාලය තුළ ඉතිරි කිරීමේ බැංකු ශාඛාවක් පිහිටුවා ගැනීමටත් ඒ පිළිබඳව සිසුන් දැනුම්වත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරමින් ප්‍රදේශයේ බැංකුවක කළමණාකාරතුමාට කරනු ලැබෙන ඉල්ලීමක් දැක්වෙන ලිපියක් සකස් කරන්න. (වචන 100 ක් පමණ ප්‍රමාණවත් ය)

නැතහොත්

ආහාර බෝග වගාවන් සඳහා පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය බහුලව සිදුවන අතර එය මනුෂ්‍ය ශරීරයට අහිතකර ලෙස ක්‍රියා කර ලෙඩ රෝග බෝවන ප්‍රවණතාවයක් ඇති බව ප්‍රකට කරුණකි. එයට විකල්පයක් වශයෙන් කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතයේ වැදගත්කම පිළිබඳව ගම්බද ගොවීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් ප්‍රදේශයේ කෘෂිකර්ම හා කෘෂි පර්යේෂණායතනයේ මෙහෙයවීමෙන් සිදුවන බව දන්වා ගම්වාසීන් අතර බෙදා හැරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ඔබ ප්‍රදේශයේ ගොවි ජන සමිතියේ ලේකම් ගෝමී සිරිවර්ධන යයි සිතන්න.

(වචන 100 ක් පමණ ප්‍රමාණවත් වේ.) (ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

21 | S | III

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

10 ශ්‍රේණිය
Grade 10

සිංහල භාෂාව හා සාහිත්‍යය - III
Sinhala language and literature - III

පැය දෙකයි
Two hours

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) ගුත්තිල කාව්‍යයේ කතුවරයා නම් කරන්න.
(ආ) ගුත්තිල කාව්‍යය ලියැවුණේ කුමන සාහිත්‍ය යුගයක දී ද?

(ii) (අ) පන්සිය පනස් ජාතක පොත ලියැවුණේ කී වැනි සියවසේ ද?
(ආ) එම යුගයේ රජ කළ රජු නම් කරන්න.

(iii) (අ) ගුත්තිල කාව්‍යය ලියැවුණු යුගයේ රජ කළ රජු නම් කරන්න.
(ආ) ගුත්තිල කාව්‍යය රචනා කරන ලෙස ආරාධනා කළේ කවුරුන් ද?

(iv)
වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියපත් විදිමිනි
පුරඹර වසමින් සිටි රග කුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැනවූ වැනි

(අ) කුරුල්ලන් අහසේ රැස්ව සිටියේ කෙසේ ද?
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(v) (අ) පන්සිය පනස් ජාතක ලියැවුණේ කාගේ අනුග්‍රහයෙන් ද?
(ආ) පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍ර වූ කෘතිය කුමක් ද?

(vi) (අ) ගුත්තිල කාව්‍යයේ ඇතුළත් පද්‍ය සංඛ්‍යාව කීය ද?
(ආ) ගුත්තිල කාව්‍යය රචනා කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(vii) පන්සිය පනස් ජාතක පොතෙහි ලක්ෂණ දෙකක් ලියන්න.
(අ) ..............................................................................
(ආ) ..............................................................................

(viii) (අ) ජාතක කතාවක දක්නට ලැබෙන අංග මොනවාද?
(ආ) ජාතක කතා ඇසුරින් රචිත ගී කාව්‍යයක් නම් කරන්න.

(ix) (අ) ගුත්තිල කාව්‍යයේ ආරම්භක පද්‍යය ලියැවී ඇත්තේ කුමන ගණයකින් ද?
(ආ) ගුත්තිල කාව්‍ය කතුවරයාගේ ගුරු හිමියන් නම් කරන්න.

(x) "පින්වත්ති, නොයව, මම ගොවියා පුතු නොවැන්දෙමි."
(අ) ඉහත උද්ධෘතය උපුටා ගත් පාඩම නම් කරන්න.
(ආ) මෙහි 'ගොවියා පුතු' යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් පිළිබඳව ද?

(ලකුණු 04 x 05 = 20)

02 පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) නවතා ගිගිරියේ
අසන ලෙස කන් පිරියේ
කැර කන් බිහිරියේ
කරන වෙණ ගායනා සරියේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

(ii) "ඒ ගිරා පණ්ඩිතයන්ගේ මෙ බඳු වතෙක් ඇත්තේ ය. ඉදින් කිසි තෙනෙකින් ගෙනා හස්නක් පණ්ඩිතයන් වහන්සේට පමණක් කිව යුතු වී නම් උන් වහන්සේ ගේ දසරුවට බස්නාහ. ඉදින් අමරා දේවීනුත් ඇසුව මනා වී නම් ඇකයෙහි ගොස් නිදිනාහ."

(අ) සිරිතක් සහ උරහිසට යන පද සඳහා කතුවරයා භාවිත කර ඇති වචන දෙක ලියන්න.
(ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) රුති වනපෙතිනැවිදින් සුමුවෝයා
නිති මියුරුති වෙණ නදළමුවෝයා
සිතිවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගනිති මිනිසුන් සමුවෝයා

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) පද්‍යයේ සඳහන් උපමාව ලියන්න.

(iv) "බ්‍රහ්මදත්ත රජ්ජුරුවන්ගේ යෝධයෝ උනට කිසිවකුත් කොට ගත නො හී ගෙඩි බැට කා, අත පය හිස නළලැ ලේ පිස පසු බල බලා දිවන්නාහු........"

(අ) ඉහත උද්ධෘතයේ සඳහන් ශබ්දාලංකාරය නම් කරන්න.
(ආ) මෙම පාඨය හා අවස්ථා සම්බන්ධය ලියන්න.

(v) යටැසින් ලන බැල්මෙන් සුර විලසී
වෙසෙසින් දන මන මත් කර එකසී
අහසින් බැස රඟ ගත් රඟ කෙලෙසී
දිසි මෙන් විය විදුලිය සිය දහසී

(අ) මෙහි පළමු පද්‍ය පාද දෙකෙහි අර්ථය ලියන්න.
(ආ) මෙම පද්‍යයේ සඳහන් උපමාව කුමක් ද?

(ලකුණු 4 × 5= 20)

03. (i) මහෞෂධ පඬිතුමාගේ චරිතයේ ශ්‍රේෂ්ඨ ලක්‍ෂණත්
(ii) කේවට්ට චරිතයේ අධම ගති ලක්‍ෂණත්

සතර කන් මන්ත්‍රණයේ නියමිත කොටසින් නිරූපණය කෙරේ. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

අවස්ථාවට ගැළපෙන පරිදි
(i) සරල බස් වහරත්
(ii) වියත් වහරත්

භාවිතය නිසා සතර කන් මන්ත්‍රණය රසවත් කථාංගයක් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙකක් බැගින් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15)

04. (i) ශබ්දාලංකාර භාවිතයත්
(ii) අර්ථාලංකාර භාවිතයත්

මැනවින් සිදු කිරීම නිසා වෙණ මිහිර රසවත් වී ඇත. නියමිත කොටස ඇසුරින් නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(i) රූස්ව සිටි සත්ත්ව පිරිස්
(ii) දෙව් මිනිස් පිරිස්

වීණා වාදන තරගය රස විඳි අයුරු චිත්තාකර්ෂණීය අයුරින් වර්ණනා කිරීමට ගුත්තිල කවියා දක් වූ සමත්කම ප්‍රශංසනීය ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15)

- **05, 06, 07 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.**

05. මහෞෂධ පඬිතුමාගේ ප්‍රඥාව ඉස්මතු කිරීම උම්මග්ග ජාතකයේ අරමුණයි. නිර්දිෂ්ට කොටස ඇසුරින් නිදසුන් තුනක් දක්වමින් විමසන්න. (ලකුණු 10)

06. ගුත්තිලයේ වෙණ මිහිර රසවිඳීමේ දී සහෘද සිත් තුළ චිත්තරූප මැවේ. උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. සතර කන් මන්ත්‍රණය පාඩමේ බොහෝ අවස්ථාවල කේවට්ට චරිතය උපහාසයට ලක්වේ. සුදුසු නිදසුන් තුනක් දක්වමින් විමසන්න. (ලකුණු 10)